(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 435.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2015 පෙබරවාරි මස 19 වැනි බ්‍රහස්පතින්දා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3713/'13

1.

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) (i) 2010, 2011 සහ 2012 වර්ෂවලදී ජනාධිපති අරමුදලට ලැබුණු මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම මුදල් සම්පාදනය කරගත් ආකාරය කවරේද;

යන්න වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ජනාධිපති අරමුදලින් පසුගිය වර්ෂ දෙක තුළ දී වැය කරනු ලැබූ සමස්ත මුදල;

(ii) එක් එක් ක්ෂේත්‍රය අනුව වැය කළ මුදල;

කොපමණද යන්නත් වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ජනාධිපති අරමුදලින් වෛද්‍ය ප්‍රතිකාර සඳහා ආධාර ලබා දීම සඳහා පුද්ගලයින් තෝරා ගැනීම සිදුකරන පදනම කවරේද;

(ii) පසුගිය වර්ෂ 03ක කාලය තුළ ප්‍රාදේශීය සභා, පළාත් සභා සහ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරුන් වෙනුවෙන් වෛද්‍ය ප්‍රතිකාර සඳහා ජනාධිපති අරමුදලින් ආධාර ලබා දී තිබේද;

(iii) එසේ නම්, ඔවුන්ගේ නම් සහ එක් එක් තැනැත්තාට ලබා දුන් මුදල් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3922/'13

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) මහනුවර නගරය තුළ එක්රැස්වන කැළිකසළ මහනුවර, ගොහාගොඩ ප්‍රදේශයේ මහවැලි ගඟ ආසන්නයේ වූ ස්ථානයකට බැහැර කරන බවත්;

(ii) එම ස්ථානය අසල සත්ව ගොවිපළක් පවත්වාගෙන යනු ලබන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ස්ථානයේ සත්ව ගොවිපළක් පවත්වාගෙනයෑම සඳහා නීත්‍යානුකූල අවසරයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම අවසරය ලබා දී ඇති ආයතනයේ හෝ ආයතනවල නම් කවරේද;

(iii) එම සත්ව ගොවිපළෙහි හිමිකරුගේ නම සහ ලිපිනය කවරේද;

(iv) එකී සත්ව ගොවිපළේ හිමිකරු එම ව්‍යාපාරයට අමතරව වෙනත් ආයතනයක රැකියාවක් කරනු ලබන්නේ නම්, එම ආයතනයේ නම සහ ඔහු විසින් දරනු ලබන තනතුර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4769/'14

3.

ගරු අශෝක් අබේසිංහ මහතා,— මුස්ලිම් ආගමික කටයුතු හා තැපැල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ස්ථිර සේවයේ යෙදී සිටින උප තැපැල් ස්ථානාධිපතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) රාජ්‍ය සේවකයන්ට හිමි වරප්‍රසාද උප තැපැල් ස්ථානාධිපතිවරුන්ට ද ලබා දෙන්නේද;

(iii) සෙනසුරාදා දින රාජකාරී කිරීම වෙනුවෙන් උප තැපැල් ස්ථානාධිපතිවරුන්ට අමතර දීමනාවක් ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4845/'14

4.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය ප්‍රමිතියෙන් තොර බලාගාරයක් බව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ප්‍රකාශකර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) එම බලාගාරයේ,

(i) පළමුවන අදියර වෙනුවෙන් ඇස්තමේන්තුගත මුදල හා වැය කළ මුදල කොපමණද;

(ii) ප්‍රමිතිය, උපකරණ හා ක්‍රියාකාරී තත්ත්වය සම්බන්ධයෙන් අදාළ ඉදිකිරීම් සමාගම සමග වගකීම් කාලයක් සහිත ගිවිසුමකට එළැඹ සිටියේද;

(iii) ප්‍රමිතියෙන් තොර තත්ත්වය හා සිදුවන අක්‍රියවීම් සම්බන්ධයෙන් බලාගාරය ඉදිකළ සමාගමට එරෙහිව ගත් ක්‍රියාමාර්ග කවරේද;

(iv) අලුත්වැඩියාවන්වලට සහ එම කාලය තුළ අහිමි වූ විදුලි බලය ලබා ගැනීමට වැය වූ අතිවිශාල මුදල ඊට වගකිව යුත්තන්ගෙන් අය කර ගැනීමට කටයුතු කරන්නේද;

(v) පළමුවැනි අදියර නිසි පරිදි ඉදි නොකළ සමාගම විසින්ම එහි ඊළඟ අදියරයන්ද ඉදිකරනු ලබන්නේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉදිරියේදී මහජනතාවට ප්‍රතිලාභ ලබා දිය හැකි වන පරිදි විදුලිය නිපදවීමට සැලසුම් කර තිබේද;

(ii) විදුලි බිල අඩුවීමට හේතු වන එම සැලසුම දින වකවානු සහිතව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5183/'14

5.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වැඩ අවසන්ව ඇති නොරොච්චෝල ගල් අඟුරු තාප බලාගාරයේ මෙගාවොට් 300ක ධාරිතාව සහිත පළමුවැනි අදියරේ වර්තමාන මෙහෙයුම් කටයුතු සහ නඩත්තු කටයුතු සිදු කරන සමාගම කවරේද;

(ii) එම වගකීම පවරනු ලැබූ දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත බලාගාරයේ මෙහෙයුම් කටයුතු සහ නඩත්තු කටයුතු ඉදිරියට පවත්වාගෙන යාම සඳහා එහි ඉදිකිරීම් කටයුතු සිදු කළ චීන සමාගමට පැවරීමට කටයුතු යොදා තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) මෙම බලාගාරයේ 2 වැනි සහ 3 වැනි අදියරයන්හි වැඩ කටයුතු නිම කිරීමට නියමිතව ඇති දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5196/'14

6.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මකවන ගල් අඟුරු බලාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම බලාගාරවල නම් කවරේද;

(iii) අලුතින් ඉදිකිරීමට යෝජිත ගල් අඟුරු බලාගාර සංඛ්‍යාව කොපමණද;

(iv) එම බලාගාර ස්ථාපිත කරන ප්‍රදේශ කවරේද;

(v) එම ඉදිකිරීම් සඳහා අවශ්‍ය ඉඩම් ලබා ගැනීමේ ක්‍රමවේදය කවරේද;

(vi) නොරොච්චෝලේ තාප විදුලි බලාගාරයෙන් දැනට ජනනය කර ඇති විදුලි ඒකක සංඛ්‍යාව කොපමණද;

(vii) එය ශ්‍රී ලංකාවේ විදුලිබල අවශ්‍යතාවයෙන් කොපමණ ප්‍රතිශතයක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5416/'14

7.

ගරු අජිත් කුමාර මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කය තුළ පුද්ගලික අංශය හා රජය මගින් පවත්වාගෙන යන රථ ගාල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටි ස්ථාන කවරේද;

යන්න පළාත් පාලන ආයතන මට්ටමින් එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) (i) රජයේ ඉඩම් රථ ගාල් පවත්වාගෙන යාම සඳහා පෞද්ගලික අංශයට ලබා දීමේ ක්‍රමවේදය කවරේද;

(ii) වර්ෂ 2011 - 2013 කාල පරිච්ඡේදය තුළ එසේ බදු දීමෙන් ලැබූ ආදායම කොපමණද;

(iii) එම රථ ගාල්වල එක් එක් වාහන වර්ගය අනුව අය කරනු ලබන ගාස්තු කවරේද;

(iv) ගාස්තුව තීරණය කිරීමේ නිර්ණායක කවරේද;

(v) එම නිර්ණායක සකස් කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) රථ ගාල් නඩත්තු කරන ආයතනය සහ අදාළ වැය ශීර්ෂය කවරේද;

(ii) රථ ගාල්වලට සිදුවන අලාභහානි ඒවා ලබාගෙන ඇති පාර්ශ්වයන්ගෙන් පියවා ගැනීමේ ක්‍රමවේදයක් තිබේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) රජයේ ඉඩම් පුද්ගලික අංශය වෙත පවරාදීමේ අරමුණ කවරේද;

(ii) රජය විසින් රථ ගාල් පවත්වාගෙන යාමේ වගකීම නොදරන්නේ මන්ද;

(iii) රජය විසින් මහජන රථ ගාල් පවත්වාගෙනයාමේ ඉදිරි සැලසුමක් තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

4088/'13

8.

ගරු බුද්ධික පතිරණ මහතා,— මුස්ලිම් ආගමික කටයුතු හා තැපැල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) දිවයින පුරා පිහිටි තැපැල් කාර්යාල ජාලගත කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති බව දන්නේද;

(ii) ඒ සඳහා ගිවිසුම ඇති කර ගන්නා ලද ආයතනයේ නම කවරේද;

(iii) එම ගිවිසුම අත්සන් කිරීමට ප්‍රථම ශක්‍යතා අධ්‍යයනයක් සිදු කරනු ලැබුවේද;

(iv) අදාළ ගිවිසුමෙහි පිටපතක් මෙම සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන්නේද;

(v) එම ගිවිසුම අත්සන් කරන ලද දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) තැපැල් කාර්යාල ජාලගත කිරීමේ ව්‍යාපෘතිය සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(ii) එම ව්‍යාපෘතියේ කාල සීමාව කොපමණද;

(iii) ජාලගත කරන ලද තැපැල් කාර්යාල සංඛ්‍යාව අදියරෙන් අදියර, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4467/'13

9\.
ගරු අනුර දිසානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010, 2011 හා 2012 යන වර්ෂවලදී එක්සත් ජනපදයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය Patton Boggs නමැති සමාගම සමග ගනුදෙනු කර තිබේද;

(ii) එසේ නම්, එම ගනුදෙනු සිදුවී ඇති දින වකවානු කවරේද;

(iii) එම ගනුදෙනු තුළින් ඉටු කර ගෙන ඇති කාර්යය හෝ කාර්යයන් කවරේද;

(iv) එමගින් ලැබී ඇති ප්‍රයෝජන කවරේද;

(v) එම කටයුතු වෙනුවෙන් කරන ලද ගෙවීම්වල වටිනාකම කොපමණද;

(vi) ඒ සඳහා මුදල් වෙන් කරනු ලැබූ වැය ශීර්ෂය කවරේද;

(vii) එම සමාගම සමග ගිවිසුම්වලට එළැඹ ඇත්නම්, එම ගිවිසුම් සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4777/'14

10\.
ගරු අශෝක් අබේසිංහ මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ මැලේරියා රෝගය සම්පූර්ණයෙන් තුරන් කර තිබේද;

(ii) ශ්‍රී ලංකාව තුළ මෑතකදී මැලේරියා රෝගීන් නැවත හඳුනාගත් බව දන්නේද;

(iii) ඩෙංගු රෝගය මර්දනය කිරීම සඳහා දේශීයව නිපදවූ BTI කීට නාශක යෙදවීම ආරම්භ කර තිබේද;

(iv) ඩෙංගු මර්දනය කිරීම සඳහා ගෙන්වන ලද විදේශීය BTI කීට නාශක සම්පූර්ණයෙන්ම බෙදා හැර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5023/'14

11\.
ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගම්පහ දුම්රිය ස්ථානයේ සංවර්ධන කටයුතු සිදුකරනු ලබන කොන්ත්‍රාත් ආයතනයේ නම කවරේද;

(ii) එම ආයතනය තෝරා ගනු ලැබූ පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ආයතනය සිදු කරන ඉහත සඳහන් දුම්රිය ස්ථානයේ සංවර්ධනය සඳහා වූ යෝජිත සැලැස්ම ඉදිරිපත් කරන්නේද;

(ii) එම සංවර්ධන කටයුතු සඳහා වැය වන මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5198/'14

12.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා මිරර් (Sri Lanka Mirror) නමැති වෙබ් අඩවිය එවකට ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ ලියාපදිංචි කර තිබුණේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) එම ලියාපදිංචිය සඳහා අය කරන ලද ගාස්තු කවරේද;

(iv) නියමිත පරිදි ලියාපදිංචි කර තිබූ එම වෙබ් අඩවිය පවත්වාගෙන ගිය ස්ථානය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් පරීක්ෂාවට ලක් කර, එහි තිබූ පරිගණක ඔවුන්ගේ භාරයට ගෙන තිබේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ඉහත ක්‍රියා කලාපයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කළ මූලික අයිතිවාසිකම් නඩු 2කට අදාළව ලබා දී ඇති තීන්දුවකට අනුව, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරයට ගත් පරිගණක ශ්‍රී ලංකා මිරර් ආයතනයට ආපසු භාර දී තිබේද;

(ii) අමාත්‍යාංශයේ ලියාපදිංචි පුවත් වෙබ් අඩවියකට අන්තර්ජාල පහසුකම් සපයන ආයතනවල සේවා අඩාලවීම නිරන්තරවම සිදු වන්නේ නම්, අමාත්‍යාංශයට ගත හැකි ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5422/'14

13.

ගරු අජිත් කුමාර මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල මහ රෝහලේ සී. ටී. ස්කෑනර් යන්ත්‍රය සැලකිය යුතු කාලයක සිට අබලන් වී ඇති බවත්;

(ii) එම ස්කෑනර් යන්ත්‍රය අබලන් වීම හේතුවෙන් රෝහලට පැමිණෙන රෝගීන්ට එම සේවාව ලබා ගැනීම සඳහා පෞද්ගලික ආයතන කරා යැමට සිදුවීමෙන් විශාල වියදමක් දැරීමට සිදුවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම සී. ටී. ස්කෑනර් යන්ත්‍රය අලුත්වැඩියා කිරීමට හෝ නව සී. ටී. ස්කෑනර් යන්ත්‍රයක් සවි කිරීමට මේ වන විට කිසියම් ක්‍රියා මාර්ගයක් ගෙන තිබේද;

(ii) ඒ සඳහා කොපමණ කාලයක් ගතවේද;

(iii) ඒ සඳහා අමාත්‍යාංශය දරන වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4265/'13

14.

ගරු බුද්ධික පතිරණ මහතා,— මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දක්ෂිණ අධිවේගී මාර්ගය මාතර, ගොඩගම සිට හම්බන්තොට, මත්තල දක්වා දීර්ඝ කිරීමට කටයුතු කරන බවත්;

(ii) තිහගොඩ, කිරින්ද සහ දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට ආසන්නම දක්ෂිණ අධිවේගී මාර්ගයට පිවිසුම් ස්ථානය ලෙස අපරක්ක මාර්ගය යෝජනා කර මිනුම් කටයුතු පවා සිදුකර ඇති බවත්;

(iii) යෝජිත අපරක්ක පිවිසුම් මාර්ගය වෙනස් කර එය කිරින්ද-පුහුල්වැල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ, වලකන්ද ප්‍රදේශයට ගෙන යාමට සැලසුම් කර ඇති බවත්;

(iv) පිවිසුම් මාර්ගය ඉහත (iii) හි සඳහන් පරිදි වෙනස් කිරීමකට ලක් වුවහොත් වැඩි ජන කොටසකට ප්‍රතිලාභ ලැබීමට ඇති අවස්ථාව අහිමි වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, දක්ෂිණ අධිවේගී මාර්ගයට පිවිසුම් ස්ථානය ඉහත අ(iii)හි සඳහන් පරිදි වෙනස් නොකිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4469/'13

15.

ගරු අනුර දිසානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010, 2011 හා 2012 යන වර්ෂවලදී එක්සත් ජනපදයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය Qorvis Communications නමැති සමාගම සමග ගනුදෙනු කර තිබේද;

(ii) එසේ නම්, එම ගනුදෙනු සිදුවී ඇති දින වකවානු කවරේද;

(iii) එම ගනුදෙනු තුළින් ඉටුකර ගෙන ඇති කාර්යය හෝ කාර්යයන් කවරේද;

(iv) එමගින් ලැබී ඇති ප්‍රයෝජන කවරේද;

(v) එම කටයුතු වෙනුවෙන් කරන ලද ගෙවීම්වල වටිනාකම කොපමණද;

(vi) ඒ සඳහා මුදල් වෙන් කරනු ලැබූ වැය ශීර්ෂය කවරේද;

(vii) එම සමාගම සමග ගිවිසුම්වලට එළැඹ ඇත්නම්, එම ගිවිසුම් සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා ,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"සුජීව සේනසිංහ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.

දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත,— දෙවැනි වර කියවීම.

*3.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත —විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2014 අගෝස්තු 07) [1]

*4.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— එක්සත් ජාතීන්ගේ පනත යටතේ නියෝග,— 1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනතේ 2 වැනි වගන්තිය යටතේ විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 දෙසැම්බර් 11 දිනැති අංක 1892/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.02.05 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*6.

මුදල් අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2014 සැප්තැම්බර් 30 දිනැති අංක 1882/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.12.12 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ නියෝග,— ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ නිර්දේශ මත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 54 වැනි වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරිය විසින් සාදන ලදුව, 2014 ඔක්තෝබර් 10 දිනැති අංක 1883/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.24 දින ඉදිරිපත් කරන ලද නියෝගය (විදුලිබල පරීක්ෂකවරුන්ගේ කාර්යය, කර්තව්‍ය හා කාර්යපටිපාටි) අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 3),— 2014.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යොන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ චෙක් ජනරජයේ ආණ්ඩුව අතර 2011 මාර්තු මස 28 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජූලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*12.

අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ නියෝග,— කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

ඉඩම් අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි

වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

15.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

16.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

17.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

18.

මෙඩිසිනා ඕල්ටනේටිවා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

19.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

20.

අල් ජමියාතුල් ඉහ්වියියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

21.

ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---